# කඩිනම් ආර්ථික සංවර්ධනය පිණිස ජනතාව ශක්තිමත් කිරීම

'ජනතාව ශක්තිමත් කිරීම තුළින් ආර්ථික සංවර්ධනය කඩිනම් කළ හැක්කේ කෙසේ ද?' යන්න විෂය කරගත් සාකච්ඡාවක් සිය 'සංවාද' සාකච්ඡා පෙළ යටතේ පාත්ෆයින්ඩර් පදනම විසින් 2009 දෙසැම්බර් මාසය තුළ කොළඹ දී පවත්නනු ලැබී ය.

ආර්ථික විද්‍යාඥයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, විශ්ලේෂකයන්, මාධ්‍යකරුවන් මෙන් ම ජනතා නියෝජිතයන් ද සහභාගි වූ මෙම සංවාද වැඩසටහන මෙහෙයවන ලද්දේ ඩබ්ලියු. ඒ. විජේවර්ධන, ආචාර්ය අනුර ඒකනායක, ආචාර්ය ලලිතසිරි ගුණරුවන්, මන්ජුල ද සිල්වා සහ චරිත රත්වත්ත, යන විද්වතුන් විසිනි.

## ජාතිය මුහුණ දෙන අභියෝගය

නිදහස ලැබීමෙන් පසුව මන්දගාමී ගමනක යෙදුණු ශ්‍රී ලංකාව ඉකුත් දශක තුනක කාලය තුළ දී සියයට 11 ක් වැනි ප්‍රතිශතයක උද්ධමනයකට ද මුහුණ දෙන අතර සියයට පහකටත් අඩු ප්‍රමාණයක සාමාන්‍ය වර්ධන වේගයක් සහිතව ඉදිරියට පැමිණි බව පෙන්වා දෙමින් සැසියෙහි මූලාසනය හෙබවූ විජේවර්ධන මහතා ප්‍රස්තුත විෂය සභාව ඉදිරියෙහි තැබී ය. සියයට පහක ආර්ථික වර්ධනය වූකලී අමතර පරිශ්‍රමයකින් තොරව සාක්ෂාත් කරගතහැකි වන්නක් බවත් ස්වකීය ජනතාව ගේ ජීවන තත්ත්වයන් උසස් තැනකට ගෙන ඒමට නම් සියයට 9 සිට 10 දක්වා වූ වාර්ෂික වර්ධන වේගයක් සහිතව පෙරට යාමට ඉදිරි දශක දෙකක් වැනි කාලය තුළ දී ශ්‍රී ලංකාව ප්‍රයත්න දැරිය යුතු බවත් හෙතෙම සඳහන් කෙළේ ය. ආර්ථික සමෘද්ධිය ළඟා කරගත හැකි වන්නේ සියලු ම රටවැසියන් විෂයෙහි සැලකිල්ල යොමු කැරෙන 'සමස්ත වර්ධනයක්' ඔස්සේ ම පමණකි. මේ සඳහා සමාජමය වශයෙන් බලපාන්නා වූ අවහිරතාවන් රටෙහි විවිධ සමාජ කණ්ඩායම්වලට අයත් වන පිරිස් අතරින් කිසිවකු ඉදිරියේ හෝ ඇති නොවන පරිදි සියල්ලනට ම සාධාරණ වූ තිරසාර වර්ධනයක් ලැබීමේ අවස්ථාව උදා කර දෙමින් සෑම පුද්ගලයකු ම ආර්ථිකමය, දේශපාලනමය හා සමාජමය යන අංශයන් ගෙන් ශක්තිමත් කරවීම අවශ්‍ය වන්නේ ය. ප්‍රතිපත්ති සම්පාදකයන් හා දේශපාලකයන් මෙන් ම වගකිව යුතු සෙසු සමාජ කණ්ඩායම් ද මුහුණ දෙන අභියෝගය එය වන බව හෙතෙම ප්‍රකාශ කෙළේ ය.

## මෙම අභියෝගයට මුහුණ දෙන්නේ කෙසේ ද?

අනතුරුව චරිත රත්වත්ත මහතා සංවාද වැඩසටහන ඉදිරියට ගෙන යමින් ' කඩිනම් ආර්ථික සංවර්ධනය සඳහා ජනතා ශක්තිමත්කරණ වැඩසටහනක් ' යන මැයෙන් පාත්ෆයින්ඩර් පදනම විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති පත්‍රිකාවක අන්තර්ගත වැදගත් නිර්දේශයන් සභාව ඉදිරියෙහි තැබී ය. ශ්‍රී ලංකාවෙහි නිශ්චල දේපළ අංශයේ සංවර්ධනය හා අදාළ කරුණු 12 ක් මෙම පත්‍රිකාවෙන් විමර්ශනයට භාජන කරනු ලැබ තිබිණි.

## 1 - ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර පවත්වාගෙන යාමේ දුෂ්කරතාව

ව්‍යවසායකයන් හෝ ව්‍යාපාර හවුලකරුවන් හෝ වශයෙන් ජනතාව ශක්තිමත් කරවීමට නම් ව්‍යාපාර හිතෛෂී වූ පරිසරයක් රට තුළ පැවතිය යුතු බව රත්වත්ත මහතා සඳහන් කෙළේ ය. එසේ වුව ද ව්‍යාපාරයන් හි යෙදීම පහසු කරවනු වෙනුවට මෑත අතීතයේ දී සිදු වූයේ ව්‍යවසායකත්වය දුෂ්කර වූ රටක් වශයෙන් ලෝක දර්ශකයන් තුළින් ද ප්‍රකාශ වන තැනට මෙරට පත් කරවීමයි. ව්‍යාපාරයන් හි යෙදීමේ දුෂ්කරතා සහිත රටවල් පිළිබඳ මෙකී දර්ශකයෙහි 97 වැනි ස්ථානයට 2009 වර්ෂයේ දී පත්ව තුබුණු ශ්‍රී ලංකාව 2010 වන විට 105 වැනි ස්ථානයට පත් වී ය. රත්වත්ත මහතා සඳහන් කෙළේ ගාස්තු ඉහළ දැමීම හේතු කොට ගෙන මෙරට තුළ ඉදි කිරීම් බලපත්‍ර ලබාගැනීම ඉමහත් දුෂ්කර කාර්යයක් බවට පත්ව තිබෙන බව සහ එම තත්ත්වය කුඩා ව්‍යාපාර කරුවන් විෂයෙහි දැඩි සේ බල පාන බවයි. එක් ඉදිකිරීම් ව්‍යාපෘතියක් වෙනුවෙන් අනුමැතිය ලබාගැනීමේ පියවර 22 ක් පසු කළ යුතු වූ අතර එක් පුද්ගලයකු ගේ සාමාන්‍ය ආදායම මෙන් 15 ගුණයක පිරිවැයක් සහිත වූ එකී කාර්යය සඳහා දින 212 ක් තරම් වූ දීර්ඝ කාලයක් ගත වන බව ද හෙතෙම උදාහරණ වශයෙන් දැක්වී ය.

මේ අනුව මෙම ප්‍රතිපත්ති පත්‍රිකාව මඟින් නිර්දේශ කරනු ලැබ තුබුණේ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරයන් හි යෙදීමේ දුෂ්කරතාව පිළිබඳ අධ්‍යයනයක යෙදී ම, අතිශය වැදගත් කාර්යයක් සේ සලකා අනිවාර්යයෙන් ම හය මසක් නො ඉක්මවන්නා වූ පූර්ව නිශ්චිත කාල රාමුවක් අතුළත ක්‍රියාත්මක කළ යුතුව තිබෙන බව ය.

## 2 - විනිමය පාලනය හේතු කොටගෙන නිර්මාණය වූ අවහිරතා

දෙවැනි ලෝක යුද්ධය සමයේ දී තාවකාලික පියවරක් වශයෙන් හඳුන්වා දෙනු ලැබූ විනිමය පාලන විධිධානයන් අවාසනාවකට මෙන් නිදහස ලැබීමෙන් පසුව මෙරටෙහි ස්ථිර නීතියක් බවට පත් වී ඇති ආකාරය මෙම ප්‍රතිපත්ති පත්‍රිකාවෙහි සඳහන් ය. නිත්‍ය විනිමය අනුපාත ක්‍රම ඒ ඒ රටවල් අතර භාවිතයෙහි පැවතීමේ හා ඒ ඒ රටවල අභ්‍යන්තර මිල ස්ථාවරත්වයන් මෙන් ම ස්වකීය ව්‍යවහාර මුදලෙහි විදේශීය වටිනාකම පවත්වාගෙන යෑම පිණිස ඉවහල් වන්නා වූ විධිමත් මහ ආර්ථික ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීමට අසමත් වීමේ තත්ත්වයක් පැවැති සමයේ දී විනිමය පාලනය වනාහි වැදගත් කමක් සහිත ක්‍රියාමාර්ගයක් වූයේ ය. එහෙත් නම්‍යශීලී විනිමය අනුපාතයන් පවතින්නා වූත් අභ්‍යන්තර මිල ස්ථාවරත්වයන් පවත්වාගෙන යාම සෑම රටකම අවශ්‍යතාව වන්නා වූත් නූතන ලෝකය තුළ විනිමය පාලනය වැදගත් තැනෙක ලා සැලැකෙන්නේ නැත.

එක් අතෙකින් සිය රටෙන් බැහැරට ව්‍යාප්ත වෙමින්

ලෝක ආර්ථිකය හා සම්බන්ධ වීමේ හැකියාව විනිමය පාලනය හේතු කොටගෙන දේශීය ව්‍යවසායකයනට ඇහිරී යන අතර තවත් අතෙකින් නිරන්තරයෙන් පුළුල් වෙමින් පවතින්නා වූ දේශීය ඉතිරිකිරීම්- ආයෝජන පරතරය පිරවෙන සේ ස්වකීය ප්‍රාග්ධනය මෙරටට ගෙන ඒමේ දී එමට බාධාවන්ට මුහුණ දීමට ද විදේශිකයනට සිදු වන්නේ ය. එසේ ම විනිමය පාලන නීති උල්ලංඝනය කිරීම ආශ්‍රිතව සිදුවන්නා වූ අක්‍රමිකතාවන්ට මුවා වෙමින් ස්වකීය දේශපාලන හා පෞද්ගලික විරුද්ධවාදීන් අසාධාරණ ලෙස විවිධ හිරිහැරයනට පත් කිරීමේ හැකියාව ද බලධරයනට ලැබී තිබේ.

ශ්‍රී ලංකාව විසින් 1978 දී ආරම්භ කරන ලද ආර්ථික නිර්බාධකරණ වැඩ පිළිවෙළ හැකි ඉක්මනින් සම්පූර්ණත්වයට පත් තළ යුතු බවත් ප්‍රවර්තන පනතෙහි අන්තර්ගත අසාධාරණ අංගයන් ගෙන් විනිර්මුක්ත වූ නව විනිමය කළමනාකරණ පනතක් ප්‍රවර්තන විනිමය පාලන පනත වෙනුවට ස්ථාපනය කළ යුතු බවත් මෙම ප්‍රතිපත්ති පත්‍රිකාව මඟින් නිර්දේශ කැරෙන්නේ එබැවිනි.

## 3 - ආයෝජන මණ්ඩලයට අයත් වන හා ඊට අයත් නොවන ව්‍යවසායයන් අතර වූ විෂමතාවන් ඉවත් කරවීමේ අවශ්‍යතාව

1970 වර්ෂයේ අග භාගයේ දී ශ්‍රී ලංකාව තුළ ඉටු කිරීමට ආයෝජන මණ්ඩලයට සිදු වූ වැදගත් කාර්යභාරය මෙම පත්‍රිකාව තුළ මැනවින් හඳුනගනු ලැබ තිබෙන බව රත්වත්ත මහතා ගේ අදහසයි. එසමයෙහි අප ඉදිරියේ තුබුණු අභියෝගය වූයේ විශාලව තුබුණු ඉතිරිකිරීම්-ආයෝජන පරතරය පිරවීම පිණිස වඩ වඩා විදේශ ආයෝජනයන් ආකර්ෂණය කරගනිමින් නිමැවුම් සහ රැකියා අවස්ථාවන් ඉහළ නංවා මෙරට වැසියන ගේ ආර්ථිකය යහපත් කරවීමයි. ආයෝජන මණ්ඩලයට අත් නොවන ව්‍යවසායයනට නොලැබෙන්නා වූ ද එහෙත් ආයෝජන මණ්ඩලයට අයත් වන ව්‍යවසායයට ලැබෙන්නා වූ ද ආකාරයේ දිරිගැන්වීම් ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබ තුබුණේ එබැවිනි. එහෙත් අද එවැන්නක් අවශ්‍ය වන්නේ නැත. සෑම ව්‍යවසායයක් ම අද ක්‍රියාත්මක වන්නේ එකිනෙක අතර වූ තරගයක ගැලෙමින් රැකියා අවස්ථාවන් මෙන් ම ආදායම් ද නිර්මාණය කරන ආර්ථික බලාගාරයන් ලෙසට ය. එබැවින් ආයෝජන මණ්ඩලයට අත් නොවන ව්‍යවසායයනට අදාළ නොවන නමුදු ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යවසායයනට පමණක් හිතකර වූ පහසුකම් පූර්ව ප්‍රකාශිත කාල රාමුවක් තුළ දී අහෝසි කළ යුතු බවට මෙම පත්‍රිකාවෙන් නිර්දේශ කරනු ලැබ තිබේ.

## 4 - ගුණත්වයෙන් යුතු අධ්‍යාපනයක් සැමට ම ලබා දීම

දේශීය පෞද්ගලික අධ්‍යාපන ආයතනයන් මෙන් ම විදේශීය උසස් අධ්‍යාපන ආයතනයන් ද වෙතින් එල්ල වන්නා වූ තරගයට මුහුණ දිය හැකි වන ආකාරයේ අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාවට නංවන්නනේ නම් ඉහළ අධ්‍යාපන මට්ටමක් සහිත රටක් වශයෙන් ඉදිරි පෙළේ දැනුම් නිෂ්පාදකයකු ගේ තත්ත්වයට පත් වෙමින් තරගකාරීත්ව වාසි අත් කරගැනීමේ හැකියාව ශ්‍රී ලංකාව සතුව පවතින බව මෙම පත්‍රිකාව තුළින් හඳුනාගනු ලැබ තිබේ. නේපාලය හා බංග්ලා දේශය වැනි රටවල් විසින් මෑත අතීතයේ දී මේ අංශයෙන් සාක්ෂාත් කරගනු ලැබ ඇති සාර්ථකත්වයන් මෙහි ලා ශ්‍රී ලංකාවට ආදර්ශයක් විය යුතු ය.

මේ අනුව ශ්‍රී ලංකාවෙහි පාසැල් අධ්‍යාපන ක්‍රමය තුළ මෙන් ම තෘතීය අධ්‍යාපන ක්‍රමය තුළ ද පවතින ඌනතාවන් කෙරෙහි අවධානය යොමු කරමින්, ලොව ප්‍රමුඛ දැනුම් නිෂ්පාදකයකු වශයෙන් ඉස්මතු වීමේ හැකියාව මෙරටට ලැබෙන පරිදි අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට ඉවහල් වන්නා වූ නිර්දේශයන් රැසක් මෙම පත්‍රිකාව තුළින් ඉදිරිපත් කරනු ලැබ ඇත. පාසැල් පද්ධතිය සහ විශ්ව විද්‍යාල පද්ධතිය වෙත වෘත්තීක කළමනාකරණය හඳුන්වා දීම ද කථිකාචාර්යවරුන් ද ඇතුළු ගුරුවරුන් වෙත අඛණ්ඩව පුහුණුව ලබා දීම ද නිපුණතා සහ කුසලතා පදනමින් කැරෙන වෘත්තීය ප්‍රවර්ධන ක්‍රමයක් හඳුන්වා දීම ද අධ්‍යාපන බලධරයන් ගේ නිසි අධීක්ෂණයට යටත් ගාස්තු අය කරන පෞද්ගලික පාසැල් පද්ධතියක් ස්ථාපනය කරවීම ද දේශීය විශ්ව විද්‍යාලයන් පිළිගත් විදේශීය විශ්ව විද්‍යාලයන්ට අනුබද්ධ කරවීම ද අධ්‍යාපන ක්‍රම අගැයීම හා යෝග්‍ය නිර්දේශයන් ඉදිරිපත් කිරීම පිණිස ස්ථාවර ප්‍රතිපත්ති සම්පාදක මණ්ඩලයක් පිහිටැවීම ද සඳහා වූ නිර්දේශයන් මේ අතර වේ.

## 5 - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ඉංග්‍රීසි සාක්ෂරතාව තුළින් මානව ප්‍රාග්ධන ප්‍රවර්ධනය

අනාගත ලෝකයේ නායකත්වය තීරණය වනු ඇත්තේ කිසියම් රටක් විසින් සාක්ෂාත් කරගනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ විදේශීය භාෂා සාක්ෂරතාව මත ය. දිගු කලක් තිස්සේ එංගලන්තය සමඟ පවත්වාගෙන ආ සම්බන්ධතා අනුව බලන විට විදේශීය භාෂාවක් වශයෙන් ඉංග්‍රිසි ප්‍රගුණ කිරීම ශ්‍රී ලංකාවට පහසු කාර්යයකි. ඒ අනුව ජනතා ශක්තිමත්කරණය තුළින් තිරසාර ආර්ථික සංවර්ධනයක් කරා යාමේ ක්‍රමෝපායයක් වශයෙන් ශ්‍රී ලංකා වාසීන් වෙත ක්‍රමවත් ඉංග්‍රිසි අ්‍යාපනයක් ලබා දීමට විධිධාන යෙදීම මෙම පත්‍රිකාව නිර්දේශ කරයි. පෞද්ගලික හා රාජ්‍ය යන දෙ අංශයේ ම සේවකයන් වෙත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම ලබා දෙන අතර ම ඉංග්‍රිසි භාෂාව තුළින් ප්‍රමාණවත් වර්ධනයක් කරා යාම පිණිස වැඩ කරන භාෂාව ලෙස ඉංග්‍රිසි ඉගෙන ගැනීමේ දියුණු ක්‍රම අනුගමනය කිරීම ද අවශ්‍ය වන්නේ ය.

## 6 - විශ්වසනීය සහ තිරසාර බලශක්ති සැපයුම

ආර්ථික වශයෙන් වැදගත් වන ස්ථානයන් පවත්වාගෙන යාම මෙන් ම විදුලි බලයෙන් ක්‍රියාත්මක කැරෙන විවිධ වූ පාරිභෝගික භාණ්ඩ පරිහරණය ද සඳහා විදුලි බලයෙහි ඇති අවශ්‍යතාව ද මෙම පත්‍රිකාව මඟින් හඳුනාගනු ලැබ ඇත. ආදායම සහ නිමැවුම ද සමඟ විදුලි බලය සඳහා ඇති ඉල්ලුම ද නිරායාසයෙන් ම ඉහළ යන බැවින් ආරක්ෂා සහිතව සහ විශ්වසනීය ලෙස ඔරොත්තු දෙන මිලකට ජනතාව වෙත විදුලි බලය සැපයීමට පියවර ගැනීම අවශ්‍ය ය. සියයට 8 සිට 10 දක්වා ප්‍රමාණයක ආර්ථික වර්ධනයක් ලබා ගැනීමට නම් වාර්ෂිකව සියයට 10 කට ආසන්න ප්‍රමාණයකින් විදුලි බල සැපයුම ඉහළ නැංවීම අවශ්‍ය වන බව පිළිගනු ලැබ තිබේ.

රාජ්‍ය ඒකාධිකාරයක් වූ ලංකා විදුලි බල මණ්ඩලයෙහි අතීත වාර්තාවන් එතරම් සතුටුදායක නොවන බැවින් පෞද්ගලික අංශයේ ද සහභාගිත්වය ලබාගනිමින් විදුලි බල සැපයුම සඳහා නව ව්‍යාපෘතීන් හඳුන්වා දීමට රජය පියවර ගත යුතු බවට නිර්දේශයන් මෙම ප්‍රතිපත්ති පත්‍රිකාවෙහි අඩංගු ය. මෙම පත්‍රිකාවට අනුව ඒවා ක්‍රියාත්මක විය යුතු වන්නේ රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාරයන් වශයෙන් ය.

## 7 - සේව්‍ය සේවක දෙපිරිස ම ශක්තිමත් කිරීම

නිෂ්පාදන ආයතනයන් හි ඵලදායීතාව ඉහළ නැංවිය හැකි වන පරිදි රැකියා අවස්ථාවන් වැඩි කිරීම සඳහා නම්‍යශීලී ශ්‍රම වෙළෙඳපොළක් නිර්මාණය කරවීමෙහි අවශ්‍යතාව ද මෙම පත්‍රිකාව විසින් හඳුනාගනු ලැබ ඇත. සේව්‍යයන් විසින් අසාධාරණ හා අසමාන ලෙස සලකනු ලැබීමෙන් සේවකයන් ආරක්ෂා කර ගත යුතු වන්නා සේ ම සේවකයන් ගේ අසාධාරණ බලපෑම්වලින් සේව්‍යයන් ආරක්ෂා කර ගැනීම ද අවශ්‍ය වන්නේ ය. මෙය සාක්ෂාත් කර ගත හැකි වන්නේ මෙකී ගැටුම්කාරී පාර්ශ්වයන් දෙක අතර සුහදශීලී වාතාවරණයක් නිර්මාණය වන සේ ඒ ඒ පාර්ශ්වයන් එකිනෙක විෂයෙහි වැදගත් වන ආකාරය පිළිබඳ වැටහීමක් ඔවුනොවුන් අතර ඇති කරවීමට පියවර ගැනීම තුළිනි. ඒ අනුව සේව්‍ය සේවක දෙපාර්ශ්වය ම කෙරෙහි සාධාරණත්වය ඉටු වන ආකාරයට කම්කරු නීති සංශෝධනය විය යුතු බව ද මෙම පත්‍රිකාව නිර්දේශ කරයි.

## 8 - ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත සංරක්ෂණය

ශ්‍රී ලංකාව වසර දහස් ගණනක සිට කෘෂිකර්මාන්තයේ නියැලෙන රටක් වන නමුදු මෙහි පවත්නා සීමිත ඉඩම් ප්‍රමාණයත් කෘෂිකර්මාන්තය සිය ජීවන වෘත්තිය ලෙස

තෝරාගැනීමට තරුණ පිරිස් දක්වන මැළිකමත් හේතු කොටගෙන එක්තරා සීමාවකින් ඔබ්බට එය සංවර්ධනය නොවීමේ තත්ත්වයක් දක්නට තිබේ. කෘෂිකර්මාන්තය සඳහා අති විශාල සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කරන්නට කලින් කලට පැමිණි රජයන්ට සිදු වූයේ එබැවිනි.

සේවා අංශයට වඩාත් වැදගත් තැනක් හිමි වන සේ ආර්ථිකය පුළුල් විවිධාංගීකරණයකට භාජන වෙමින් තිබීම මෙකල දක්නට ලැබෙන යහපත් තත්ත්වයකි. කෘෂි ක්ෂේත්‍රයෙහි පවත්නා අතිරික්ත ශ්‍රමය ඉන් බැහැරට යොමු කිරීමෙහි ලා මෙම වර්ධනය යම් තරමක දායකත්වයක් ලබා දෙයි. විශේෂයෙන් ම උතුරුමැද හා නැගෙනහිර යන පළාත්වල දක්නට ලැබෙන ශ්‍රම හිඟය පිළිබඳ ගැටලුවට විසඳුමක් වශයෙන් කෘෂිකර්මාන්තය යාන්ත්‍රීකරණය කිරීම සඳහා ද මෙයින් යම් දායකත්වයක් ලැබේ. කෘෂිකර්මාන්තයෙහි නියැළෙන්නන් එම අංශය තුළ ම රැඳී සිටීමට පෙළැඹවෙන සේ ප්‍රමාණවත් පාරිශ්‍රමිකයක් ඔවුනට ලැබෙන පරිදි කෘෂි ඵලදායීතාව ඉහළ නංවාලීම මෙම වර්ධනය තුළින් ඉටු කරගත යුතු ය.

විශේෂයෙන් ම වී ගොවීන් මුහුණ දෙන ගැටලු වෙත අවධානය යොමු කරන මෙම ප්‍රතිපත්ති පත්‍රිකාව, අනාගත මිල ගණන්වල ප්‍රතිලාභ අත් කරගැනීමේ හා අනපේක්ෂිත මිල උච්චාවචනයන් හි අහිතකර බලපෑම්වලින් ආරක්ෂා වීමේ හැකියාව ගොවීනට ලබා ගත හැකි වන සේ ඉදිරි වෙළෙඳපොළ ගනුදෙනු ක්‍රමයක් හඳුන්වා දීම යෝග්‍ය බව නිර්දේශ කරයි. මෙයට අමතරව කෘෂි කර්මාන්ත යාන්ත්‍රීකරණය ද කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය ද එසේ ම වී නොවන දේශීය කෘෂි නිෂ්පාදන අපනයන වෙළෙඳපොළ වෙත ඔවුන් යොමු කරවීම ද සඳහා පියවර ගත යුතු බවට ද නිර්දේශයන් මෙහි අඩංගු ය.

## 9 - කර්මාන්ත පදනම වෙනස් කරලීම

පසුගිය දශක කීපය තුළ දී ශ්‍රී ලංකාව සිය කෘෂි ආර්ථිකය වෙතින් සුළු කර්මාන්ත පදනම් කොට ගත් ආර්ථිකයක් වෙතට මාරු වී තිබේ. එහෙත් මෙම නව ආර්ථිකය බහුල වශයෙන් ඇඟලුම් කර්මාන්තය මත ම යැපීම හේතුවෙන් අනපේක්ෂිත බාහිර කම්පනයන්ට ගොදුරු වීමට ශ්‍රී ලංකාවට සිදු වෙයි. එබැවින් මෙරට කර්මාන්ත පදනම, සිංගප්පූරුව, දකුණු කොරියාව තායිවානය සහ හොංකොං වැනි රටවල් තුළ දශක කීපයකට ඉහත දී සිදු වූ සහ මැලේසියාව, ඉන්දියාව, චීනය සහ තායිලන්තය යන රටවල දැනට සිදු වෙමින් පවතින ආකාරයට අධිතාක්ෂණ කර්මාන්ත පදනමක් බවට පරිවර්තනය කළ යුතු වන්නේ ය. මේ සඳහා ආරම්භයේ දී රජය විසින් කළ යුතු වන්නේ ලොව අධිතාක්ෂණ දැවැන්තයන් මෙරටට ආකර්ෂණය කරවා ගනිමින් ඔවුන් ගේ තාක්ෂණවේදය උකහා ගැනීමට විධිවිධාන යෙදීමයි.

මෙම වැඩ පිළිවෙළ සාර්ථකත්වයට පත් කරගැනීම සඳහා වූ පූර්ව අවශ්‍යතාවන් කීපයක් මෙම පත්‍රිකාව විසින් හඳුනාගනු ලැබ ඇත. ක්ෂණික වෙනස්වීම්වලින් තොර සංස්ථිතික ප්‍රතිපත්ති සමුදායක් ඉදිරියට පවත්වාගෙ යාම ද නීතිය සා සාමය පවත්වාගෙන යාම ද මධ්‍යම ( මහ) බැංකුව විසින් ස්වාධීන වූ මහ ආර්ථික මුදල් ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාම ද විදේශීය ආයෝජනයන් පදනම් කොට ගත් ආර්ථික වර්ධනයක් සඳහා රජයේ සෑම නායකයකු වෙතින් ම නැගෙන නොවෙනස් හඬ ද යනු එකී පූර්ව අවශ්‍යතාවන් වන්නේ ය. ඒ අනුව මෙම පත්‍රිකාවෙන් නිර්දේශ කැරෙන්නේ වර්ෂ 2020 වන විට අධිතාක්ෂණ කර්මාන්තයන් පදනම් කරගත් ආර්ථිකයක් වෙත අවතීර්ණ වීම සඳහා වූ සැලැස්මක් ශ්‍රී ලංකාව සතුව තිබිය යුතු බවයි.

## 10 - සංචාරක ව්‍යාපාරයෙහි විභවතා මුළුමනින් ප්‍රයෝජනයට ගැනීම

සංචාරක ව්‍යාපාරය වනාහි ජනතා ශක්තිමත්කරණයත් ධනය ඉපැයීමත් මෙන් ම රැකියා අවස්ථා උත්පාදනයත් සඳහා ශ්‍රී ලංකාව විසින් සම්පූර්ණයෙන් ම ප්‍රයෝජනයට ගත යුතු අංශයකි. සිවිල් යුද්ධයේ අවසානයත් සමඟ ම මෙරට සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා වඩාත් යහපත් වාතාවරණයක් නිර්මාණය වී තිබෙන බව මෙම පත්‍රිකාවෙන් පෙන්වා දෙනු ලබයි.

වර්ෂ 2015 වන විට මෙරටට පැමිණෙන සංචාරකයන් ගේ සංඛ්‍යාව මිලියන 2 ක් දක්වා වැඩි කිරීම ද නැගෙනහිර සහ වයඹ පළාත් සංචාරක ව්‍යාපාරයට සුදුසු පරිදි වැඩි දියුණු කිරීම ද මඩකලපුව හා ත්‍රිකුණාමලය අතර දෙවන ජාත්‍යන්තර ගුවන් තොට ඉදි කිරීම ද මාල දිවයින් වෙත පැමිණෙන සංචාරකයන් මෙරටට සම්බන්ධ කරගනිමින් සංචාරකයනට විවිධත්වයක් නිරිමාණය කර දිය හැකි වනු පිණිස මුහුදු යාත්‍රා සේවයක් ඇති කිරීම ද ඉලක්ක කරගත් සංචාරක ව්‍යාපාරය සඳහා වූ පූර්ණ සැලැස්මක් සකස් කළ යුතු බව ඒ අනුව මෙම පත්‍රිකාවෙන් නිර්දේශ කරනු ලැබ තිබේ.

## 11 - සේවා අංශය සංවර්ධනය කරමින් එය ලෝක ආර්ථිකය හා සම්බන්ධ කරවීම

විශාල වශයෙන් ස්වාභාවික සම්පත් පවතින රටක් නොවන බැවින් ධනය ඉපැයීම පිණිස අනාගතයේ දී අපට යොමු වීමට සිදු වන්නේ මෙරට සතු උගත් මිනිස් බලය වෙතට ය. මේ අනුව බලන කල දැනට සිංගප්පූරුව හා ඉන්දියාව ක්‍රියාත්මක කරන ආකාරයට ලෝක ආර්ථිකය සඳහා සේවා සැපයීම අරමුණු කරගනිමින් මානව ප්‍රාග්ධනය යෙදැවීම පිණිස ඉතා හොඳ අවස්ථාවන් සේවා අංශය තුළ නිර්මාණය වී තිබේ. එක් රටක සිට වෙනත් රටක් වෙත සේවාවන් විතැන් කිරීමේ මෙන් ම අවශේෂ ලෝකය වෙත තරගකාරී ලෙස ආර්ථික සේවාවන් සැපයීම ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විසින් මෙහෙයැවෙන නූතන ලෝකය තුළ සාර්ථක ලෙස කළ හැකි වන්නේ ය.

## 12 - උතුරු සහ නැගෙනහිර සංවර්ධනය

යුද්ධයෙන් විනාශයට පත් උතුරු හා නැගෙනහිර පළාත්වල ආර්ථික යටිතලයන් ප්‍රමුඛතා වැඩ පිළිවෙළක් යටතේ සංවර්ධනය කරවීමේ අවශ්‍යතාව යුද්ධය අවසාන වීමත් සමඟ ම රට ඉදිරියෙහි මතු ඇත. මෙහි දී රජය මූල්‍ය ගැටලුවලට මුහුණ දෙන බැවින් මෙම පත්‍රිකාව නිර්දේශ කරන්නේ ඒ සඳහා පෞද්ගලික අංශයේ හා ආධාර ලබා දෙන්නන් ගේ සහභාගිත්වය ලබා ගැනීම යෝග්‍ය බව ය.

රත්වත්ත මහතා විසින් මෙම ප්‍රතිපත්ති පත්‍රිකාව සභාව හමුවෙහි තැබීමෙන් අනතුරුව විද්වත් මඩුල්ලෙහි සෑම සාමාජිකයෙක් ම එහි අඩංගු කාර්ය සමුදාය ක්‍රියාවට නැංවීමේ දී රට මුහුණ දෙන ගැටලු විෂයෙහි අවධානය යොමු කළහ.

ප්‍රස්තුත ප්‍රතිපත්ති නිර්දේශයන් සම්බන්ධයෙන් සිය එකඟතාව පළ කළ අනුර ඒකනායක මහතා නම්‍යශීලී ශ්‍රම වෙළෙඳපොළක් ද නවීනතම වූ අධ්‍යාපන ක්‍රමයක් ද ඉහළ ප්‍රතිලාභ ගෙන දෙන භෝග ප්‍රභේදයන් ද මේ සඳහා අවශ්‍ය වන බව පෙන්වා දුන්නේ ය. මෙවැනි පියවරයන් ක්‍රියාවට නැංවීම කෙරෙහි බාධා පමුණුවන්නා වූ රාජ්‍ය අංශයේ පරිචයන් මෙන් ම ප්‍රතිසංස්කරණ පියවරයන් ක්‍රියාවට නැංවීමේ හැකියාව අවුරාලන නීතිරීති ද දුරලීමේ අවශ්‍යතාව ලලිතසිරි ගුණරුවන් මහතා විසින් අවධාරණය කරන ලදී. ශ්‍රී ලංකා රජයේ දුම්රිය සේවය තුළ ක්‍රියාත්මකව පවතින යල් පිනූ නීති හා පරිචයන් ද හෙතෙම මෙහි දී විශේෂයෙන් ගෙනහැර දැක්වී ය. ප්‍රතිපත්ති පත්‍රිකාවෙහි ඇතුළත් සියලු ම නිර්දේශයන් විෂයෙහි සභාවෙහි අවධානය යොමු කරවූ මන්ජුල ද සිල්වා මහතා ආයෝජන මණ්ඩයට අයත් වන හා අයත් නොවන ව්‍යවසායයන් අතර පවත්නා විෂමතාවන් දුරලීම වැනි ඇතැම් නිර්දේශයන් ක්‍රියාවට නැංවීමේ දී අතිශය ප්‍රවේසම් සහගත බවකින් යුතුව කටයුතු නොකළහොත් අනාගත විභව ආයෝජකයන් තුළ සාවද්‍ය අවබෝධයන් නිර්මාණය වීමේ අවදානමක් පවතින බව ද පෙන්වා දුන්නේ ය.

සභාව මෙම සාකච්ඡාවට සහභාගි වූයේ සුවිශේෂ උනන්දුවකින් යුතුව ය. ශ්‍රී ලංකාවේ ධීවර ක්ෂේත්‍රයට අදාළ ගැටලු ද සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රශ්න ද පමණක් නොව මෑත දී මුදාගනු ලැබූ උතුරු හා නැගෙනහිර පළාත්වල ඉඩම් හිමිකම් පිළිබඳ ගැටලු ද මෙහි දී ඉදිරිපත් කිරීමට බොහෝ දෙනෙක් පියවර ගත්හ.

පාත්ෆයින්ඩර් පදනමෙහි ජාල අඩවිය වූ
**www.sanvada.org**

වෙත පිවිසීමෙන් මේ පිළිබඳ සම්පූර්ණ
වාර්තාවක් ලබා ගත හැකි ය.

# කඩිනම් ආර්ථික සංවර්ධනය පිණිස ජනතාව ශක්තිමත් කිරීම

'ජනතාව ශක්තිමත් කිරීම තුළින් ආර්ථික සංවර්ධනය කඩිනම් කළ හැක්කේ කෙසේ ද?' යන්න විෂය කරගත් සාකච්ඡාවක් සිය 'සංවාද' සාකච්ඡා පෙළ යටතේ පාත්ෆයින්ඩර් පදනම විසින් 2009 දෙසැම්බර් මාසය තුළ කොළඹ දී පවත්නනු ලැබී ය.

ආර්ථික විද්‍යාඥයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, විශ්ලේෂකයන්, මාධ්‍යකරුවන් මෙන් ම ජනතා නියෝජිතයන් ද සහභාගි වූ මෙම සංවාද වැඩසටහන මෙහෙයවන ලද්දේ ඩබ්ලියු. ඒ. විජේවර්ධන, ආචාර්ය අනුර ඒකනායක, ආචාර්ය ලලිතසිරි ගුණරුවන්, මන්ජුල ද සිල්වා සහ චරිත රත්වත්ත, යන විද්වතුන් විසිනි.

## ජාතිය මුහුණ දෙන අභියෝගය

නිදහස ලැබීමෙන් පසුව මන්දගාමී ගමනක යෙදුණු ශ්‍රී ලංකාව ඉකුත් දශක තුනක කාලය තුළ දී සියයට 11 ක් වැනි ප්‍රතිශතයක උද්ධමනයකට ද මුහුණ දෙන අතර සියයට පහකටත් අඩු ප්‍රමාණයක සාමාන්‍ය වර්ධන වේගයක් සහිතව ඉදිරියට පැමිණි බව පෙන්වා දෙමින් සැසියෙහි මුලාසනය හෙබවූ විජේවර්ධන මහතා ප්‍රස්තුත විෂය සභාව ඉදිරියෙහි තැබී ය. සියයට පහක ආර්ථික වර්ධනය වුකලී අමතර පරිශ්‍රමයකින් තොරව සාක්ෂාත් කරගතහැකි වන්නක් බවත් ස්වකීය ජනතාව ගේ ජීවන තත්ත්වයන් උසස් තැනකට ගෙන ඒමට නම් සියයට 9 සිට 10 දක්වා වූ වාර්ෂික වර්ධන වේගයක් සහිතව පෙරට යාමට ඉදිරි දශක දෙකක් වැනි කාලය තුළ දී ශ්‍රී ලංකාව ප්‍රයත්න දැරිය යුතු බවත් හෙතෙම සඳහන් කෙළේ ය. ආර්ථික සමෘද්ධිය ළඟා කරගත හැකි වන්නේ සියලු ම රටවැසියන් විෂයෙහි සැලකිල්ල යොමු කැරෙන 'සමස්ත වර්ධනයක්' ඔස්සේ ම පමණකි. මේ සඳහා සමාජමය වශයෙන් බලපාන්නා වූ අවහිරතාවන් රටෙහි විවිධ සමාජ කණ්ඩායම්වලට අයත් වන පිරිස් අතරින් කිසිවකු ඉදිරියේ හෝ ඇති නොවන පරිදි සියල්ලනට ම සාධාරණ වූ තිරසාර වර්ධනයක් ලැබීමේ අවස්ථාව උදා කර දෙමින් සෑම පුද්ගලයකු ම ආර්ථිකමය, දේශපාලනමය හා සමාජමය යන අංශයන් ගෙන් ශක්තිමත් කරවීම අවශ්‍ය වන්නේ ය. ප්‍රතිපත්ති සම්පාදකයන් හා දේශපාලකයන් මෙන් ම වගකිව යුතු සෙසු සමාජ කණ්ඩායම් ද මුහුණ දෙන අභියෝගය එය වන බව හෙතෙම ප්‍රකාශ කෙළේ ය.

## මෙම අභියෝගයට මුහුණ දෙන්නේ කෙසේ ද?

අනතුරුව චරිත රත්වත්ත මහතා සංවාද වැඩසටහන ඉදිරියට ගෙන යමින් ' කඩිනම් ආර්ථික සංවර්ධනය සඳහා ජනතා ශක්තිමත්කරණ වැඩසටහනක් ' යන මැයෙන් පාත්ෆයින්ඩර් පදනම විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති පත්‍රිකාවක අන්තර්ගත වැදගත් නිර්දේශයන් සභාව ඉදිරියෙහි තැබී ය. ශ්‍රී ලංකාවෙහි නිශ්චල දේපළ අංශයේ සංවර්ධනය හා අදාළ කරුණු 12 ක් මෙම පත්‍රිකාවෙන් විමර්ශනයට භාජන කරනු ලැබ තිබිණි.

## 1 - ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර පවත්වාගෙන යාමේ දුෂ්කරතාව

ව්‍යවසායකයන් හෝ ව්‍යාපාර හවුලකරුවන් හෝ වශයෙන් ජනතාව ශක්තිමත් කරවීමට නම් ව්‍යාපාර හිතෛෂී වූ පරිසරයක් රට තුළ පැවතිය යුතු බව රත්වත්ත මහතා සඳහන් කෙළේ ය. එසේ වුව ද ව්‍යාපාරයන් හි යෙදීම පහසු කරවනු වෙනුවට මෑත අතීතයේ දී සිදු වූයේ ව්‍යවසායකත්වය දුෂ්කර වූ රටක් වශයෙන් ලෝක දර්ශකයන් තුළින් ද ප්‍රකාශ වන තැනට මෙරට පත් කරවීමයි. ව්‍යාපාරයන් හි යෙදීමේ දුෂ්කරතා සහිත රටවල් පිළිබඳ මෙකී දර්ශකයෙහි 97 වැනි ස්ථානයට 2009 වර්ෂයේ දී පත්ව තුබුණු ශ්‍රී ලංකාව 2010 වන විට 105 වැනි ස්ථානයට පත් වී ය. රත්වත්ත මහතා සඳහන් කෙළේ ගාස්තු ඉහළ දැමීම හේතු කොට ගෙන මෙරට තුළ ඉඩි කිරීම් බලපත්‍ර ලබාගැනීම ඉමහත් දුෂ්කර කාර්යයක් බවට පත්ව තිබෙන බව සහ එම තත්ත්වය කුඩා ව්‍යාපාර කරුවන් විෂයෙහි දැඩි සේ බල පාන බවයි. එක් ඉදිකිරීම් ව්‍යාපෘතියක් වෙනුවෙන් අනුමැතිය ලබාගැනීමේ පියවර 22 ක් පසු කළ යුතු වූ අතර එක් පුද්ගලයකු ගේ සාමාන්‍ය ආදායම මෙන් 15 ගුණයක පිරිවැයක් සහිත වූ එකී කාර්යය සඳහා දින 212 ක් තරම් වූ දීර්ඝ කාලයක් ගත වන බව ද හෙතෙම උදාහරණ වශයෙන් දැක්වී ය.

මේ අනුව මෙම ප්‍රතිපත්ති පත්‍රිකාව මගින් නිර්දේශ කරනු ලැබ තුබුණේ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරයන් හි යෙදීමේ දුෂ්කරතාව පිළිබඳ අධ්‍යයනයක යෙදී ම, අතිශය වැදගත් කාර්යයක් සේ සලකා අනිවාර්යයෙන් ම හය මසක් නො ඉක්මවන්නා වූ පූර්ව නිශ්චිත කාල රාමුවක් අතුළත ක්‍රියාත්මක කළ යුතුව තිබෙන බව ය.

## 2 - විනිමය පාලනය හේතු කොටගෙන නිර්මාණය වූ අවහිරතා

දෙවැනි ලෝක යුද්ධය සමයේ දී තාවකාලික පියවරක් වශයෙන් හඳුන්වා දෙනු ලැබූ විනිමය පාලන විධිධානයන් අවාසනාවකට මෙන් නිදහස ලැබීමෙන් පසුව මෙරටෙහි ස්ථිර නීතියක් බවට පත් වී ඇති ආකාරය මෙම ප්‍රතිපත්ති පත්‍රිකාවෙහි සඳහන් ය. නිත්‍ය විනිමය අනුපාත ක්‍රම ඒ ඒ රටවල් අතර භාවිතයෙහි පැවතීමේ හා ඒ ඒ රටවල අභ්‍යන්තර මිල ස්ථාවරත්වයන් මෙන් ම ස්වකීය ව්‍යවහාර මුදලෙහි විදේශීය වටිනාකම පවත්වාගෙන යෑම පිණිස ඉවහල් වන්නා වූ විධිමත් මහ ආර්ථික ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීමට අසමත් වීමේ තත්ත්වයක් පැවැති සමයේ දී විනිමය පාලනය වනාහි වැදගත් කමක් සහිත ක්‍රියාමාර්ගයක් වූයේ ය. එහෙත් නම්‍යශීලී විනිමය අනුපාතයන් පවතින්නා වූත් අභ්‍යන්තර මිල ස්ථාවරත්වයන් පවත්වාගෙන යාම සෑම රටකම අවශ්‍යතාව වන්නා වූත් නූතන ලෝකය තුළ විනිමය පාලනය වැදගත් තැනෙක ලා සැළකෙන්නේ නැත.

එක් අතෙකින් සිය රටෙන් බැහැරට ව්‍යාප්ත වෙමින්

පාත්ෆයින්ඩර් පදනම විසින් සංවිධානය කරන ලද මහජන "සංවාද" සම්මන්ත්‍රණයකට සහභාගි වූ විද්වත් මඬුල්ලක් වෙතින් ඉදිරිපත් වුණු විශ්ලේෂණාත්මක අදහස් මෙම ප්‍රතිපත්ති සන්නිවේශනයට පදනම් වේ.

ඩබ්ලිවු. ඒ. විජේවර්ධන, ආචාර්ය අනුර ඒකනායක, ආචාර්ය ලලිතසිරි ගුණරුවන්, මන්ජුල ද සිල්වා, සහ චරිත රත්වත්ත යන මහත්වරුන් ගෙන් මෙම විද්වත් මඬුල්ල සමන්විත වී ය.

'POLICY BRIEF 19'


"පාත්ෆයින්ඩර්" පදනම

දුරකථන අංකය : 2596281
ෆැක්ස් අංකය : 2595894
ඊමේල් : info@pathfinderfoundation.org
වෙබ් අඩවිය : www.sanvada.org / www.pathfinderfoundation.org



සංස්කරණ සහාය: අමීරා අරූස් මිය, ව්‍යාපෘති කළමනාකාරිණිය.